# ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපන රටාව හා වර්තමාන අධ්‍යාපන රටාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආචාර්ය වරදිවෙල විජයසුමන හිමි[1]
අම්පේ විමලධම්ම හිමි[2]
අත්තරගොඩ පියධම්ම හිමි[3]

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පැරණි සම්භාව්‍ය අධ්‍යාපන රටාව අධ්‍යාත්මික ගුණය මුල්කරගෙන පැවති අතර එය මුළුමනින් ම පාහේ බුදුසමය මුල්කොටගෙන ගොඩනැගුණකි. එහිදී අධ්‍යාත්ම සංවර්ධනය මූලික වූ අතර භෞතික විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව ද අවධානය යොමුකර ඇත. වර්තමාන සමාජයේ අධ්‍යාපනය පිළිබඳ ඉතා උනන්දුවක් සෑම කෙනෙකු තුළ ම පවතින අතර ඒ නිසා ම එය තරගකාරී රටාවකට අවතීරණ වී ඇත. එම තරගකාරී බව විවිධ හේතු සාධක මත පදනම් වී පවතී. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් අපේක්ෂා කරන්නේ වර්තමාන තරගකාරී අධ්‍යාපනය සඳහා ලක්දිව පැවති සම්භාව්‍ය අධ්‍යාපනයෙන් ලද හැකි මගපෙන්වීම් පිළිබඳ විමසා බැලීමයි.

## අධ්‍යයනයේ අරමුණු

- වර්තමාන අධ්‍යාපන රටාවෙහි පවතින තරගකාරී ස්වභාවය විමසීම
- තරගකාරී අධ්‍යාපනයෙන් වර්තමාන අධ්‍යාපනික අරමුණු කෙතෙක් දුරට ඉටුවී තිබේදැයි විමසීම
- පැරණි සම්භාව්‍ය අධ්‍යාපනයේ මගපෙන්වීම් වර්තමාන අධ්‍යාපනයට යොදගත හැකි ආකාරය විමසීම.

## පර්යේෂණ ක්‍රමවේදය

ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයනය මගින් දත්ත රැස්කිරීම සිදුකරන අතර ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙස දත්ත විශ්ලේෂණය සිදු කෙරේ.

1 පීඨාධිපති, භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨයශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය අනුරාධපුර, wwsumana@gmail.com
2 සහකාර කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය, අනුරාධපුර, ampedhamma@gmai.com
3 සහකාර කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය, අනුරාධපුර, dhammap@rocketmail.com

**දත්ත විශ්ලේෂණය හා සාකච්ඡාව**

වර්තමානයේ අධ්‍යාපනික රටාව බෙහෙවින් තරගකාරී ස්වභාවයකට පත්ව ඇත. එය දරුවන්ගේ අධ්‍යාපනයක් පමණක් නොව දෙමාපියන්ට ද දැඩි බලපෑම් කරන තත්වයකට පත්ව ඇත. අධ්‍යාපනය භෞතික විෂය ක්ෂේත්‍රයන් පමණක් ප්‍රගුණ කරන ස්වභාවයට පත්ව ඇත. බටහිර අධ්‍යාපනික සංකල්ප තුළ උපයෝගීතා අධ්‍යාපනික සංකල්පවලට වඩාත් නැඹුරු වුව ද පෙරදිග දැකිය හැකි ලක්ෂණය වන්නේ අධ්‍යාත්මික සංවර්ධනය වඩාත් අවධාරණය වීමයි. නමුත් ඊට ප්‍රතිපක්ෂව වර්ධනය වන වර්තමාන තරගකාරී අධ්‍යාපනයෙහි පහත ලක්ෂණ දැකිය හැකිය.

- දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේදී තරගකාරී මානසිකත්වයක් ගොඩනැගීම.
- අධ්‍යාපනය ලබන පාසල් සඳහා තරගකාරී බවක් ඇතිවීම.
- තරගකාරී ජනප්‍රිය පාසල්වල අධ්‍යාපනය ඉතා හොඳින් සිදුවන බව එත්තු ගැනීම.
- සමස්ත අධ්‍යාපනික රටාව තුළ ආධ්‍යාත්මික සංවර්ධනය ප්‍රායෝගික තලයකට ගෙනඒමට දක්වන අසමර්ථතාව.

වර්තමානයේ අධ්‍යාපනය ලැබීම දැඩි තරගකාරී තලයකට පිවිස ඇත. දෙමාපියෝ තම දරුවන් නොයෙක් ආකාරයෙන් ඒ සඳහා යොමු කරවති. කුඩා දරුවා පාසලට ප්‍රවිෂ්ටවීමත් සමග තරගකාරී ලෙස අධ්‍යාපනය ලබාදීමට ඔවුන් පෞද්ගලික උපකාරක පංතිවලට යැවීම අනිවාර්ය සාධකයක් ලෙස සිතීමට දෙමාපියෝ පෙළඹෙති. ඒ නිසා දරුවාට ළමා කාලය කෙළිදෙළෙන් ගතකිරීමට, මිතුරන් ඇසුරු කිරීමට, වැඩිහිටියන් ඇසුරු කිරීමට හා පරිසරයට සංවේදී වීම වැනි කාර්යයන් අහිමි වී ඇත. ඒ වෙනුවට දැඩි වගකීමකින් හා කැපවීමකින් යුතුව අධ්‍යාපනික කාර්යයන්හි නිරත වීමට සිදුව ඇත.

අධ්‍යාපනය යනු පංතිකාමරයේදී ම ලබන අත්දැකීමක් නොවේ. කුඩා කළ සමාජානුයෝජනය උදෙසා බරපතළ කාර්යභාරයක් තමා ජීවත් වන පරිසරයෙන් හා වැඩිහිටියන්ගෙන් සිදුවේ. නමුත් පවතින වර්තමාන අධ්‍යාපනය තුළ ඒ සඳහා ඇති ඉඩප්‍රස්තා සීමා වි ඇත. ළමයින්ට ළමා ලෝකයේ සුන්දරත්වය විඳීම වෙනුවට අධ්‍යානය වෙනුවෙන් දැඩි වගකීමකින් හා කැපවීමකින් කටයුතු කිරීමට සිදුව ඇත. ඒ නිසා තමා ජීවත්වන පරිසරයෙන් සිදුවන චිත්තවේග පාලනයට හුරුවීම හා ප්‍රායෝගික අත්දැකීම් ලැබීම අහිමි වී ඇත.

දරුවන් අධ්‍යාපනය ලබන පාසල තීරණය කරන්නේ ඔවුන් ඉපදීමට ද පෙරාතුව සිටය. දෙමාපියන් ඒ සඳහා තම වාසස්ථාන පවා වෙනස් කරමින් අසත්‍ය ලිපි ලේඛන සකස් කරමින් දරුවාගේ අනාගතය සැළසුම් කරයි. දරුවන්ට කුඩා කළ සිට අසත්‍ය දේ ප්‍රකාශ කිරීමට යොමුකරවන්නේ දෙමාපියන් හා

වැඩිහිටියන් විසිනි. ඒ අනුව සදාචාරාත්මක බව තරගකාරී අධ්‍යාපනයේ මුල සිට ම පිරිහීමට පත්වන බව පැහැදිලිය.

පැවති සම්භාව්‍ය අධ්‍යාපන රටාව තුළ සදාචාරාත්මක හැසිරීම් ඉතා ඉහළින් අගය කෙරුණි. සදාචාරය ඉතා සියුම් ලෙස සෑම අවස්ථාවකදීම ආරක්ෂා කිරීමට අනුබල ලැබුණි. ගුරු, ශිෂ්‍ය හා උපාධ්‍යායක සම්බන්ධය සෑම විටම ගෞරවය හා සදාචාරාත්මක බව ආරක්ෂා වන පරිදි සිදුවිය.

වත්මන් සමාජයේ ජනප්‍රිය පාසල්හි ඉතා ඉහළ අධ්‍යාපනයක් ලැබෙතැයි අපේක්ෂා කළ ද එය දැනුම පදනම් කරගත් විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයක් වෙතට නැඹුරු වෙමින් පවතී. අධ්‍යාපනය යනු විභාග සමත්වීම පමණක් නොවන බව මෙහිලා තේරුම් ගත යුතුව ඇත.

පැරණි අධ්‍යාපන ක්‍රමය තුළ දැනුමට වඩා ප්‍රායෝගිකත්වය පැසසුමට ලක්විය. ත්‍රිපිටකය කටපාඩමින් කියනවාට වඩා එක් අධිගමනයක් හෝ ලබාගැනීම උසස් වන බව දක්වන ලද්දේ ඒ අනුවය. සදාචාරාත්මක බව කෙතරම් අගය කෙරුණේ ද යත් ඒක අවස්ථාවක ගුරුවරයා තම ගෝලයාගෙන් (සිසුවා) කමටහන් ලබාගැනීමෙන් එය පැහැදිලි වෙයි. එහෙත් වර්තමාන අධ්‍යාපන රටාව තුළ ආධ්‍යාත්මික සංවර්ධනයට එතරම් අවස්ථාවක් ලැබෙන්නේද යන්න සිතිය යුතුය. වර්තමන අධ්‍යාපන රටාව තුළම සදාචාරාත්මක බව ප්‍රායෝගික තලයකට ගෙන ඒමට අපොහොසත් වී ඇත. වැඩිහිටියන් තුළ මෙන්ම දරුවන් තුළද ව්‍යාජත්වයට මුල්තැන ලැබෙමින් පවතින පරිසරයක් ගොඩනැගෙමින් පවතී. අල්ලස දූෂණය වැනි සදාචාර විරෝධී ක්‍රියා වැඩිවෙමින් පවතී. නොඉවසිලිමත්බව, කළහකාරී බව, හා තරගකාරී බව දරුවන් තුළ මෙන්ම වැඩිහිටියන් තුළ ද වර්ධනය වෙමින් පවතී.

සම්භාව්‍ය අධ්‍යාපන රටාව තුළ පැවති ලක්ෂණය වූයේ දැඩි ශික්ෂණයක් තිබේදැයි පරික්ෂා කොට අධ්‍යාපනය ලබාදීමට යොමු කිරීමයි. ශික්ෂණය පළමු කාරණය ලෙස සිඟාලෝවද සූත්‍රයේ ද සඳහන් වේ. ලක්දිව පැරණි අධ්‍යාපනය ද එ මග ගිය බව පැහැදිලිය. ඒ සඳහා මළු ඇමදීම වැනි වතාවත් උපයෝගී කොටගෙන ඇත. එම අවස්ථාවල සිසුවාගේ හැසිරීම ගුරුවරයාගේ අධීක්ෂණයට ලක්ව ඇත.

වර්තමාන අධ්‍යාපනය තුළ සිසුවාට අවවාද කිරීම පවා නොරුස්සන තත්වයකට පත්ව ඇති බව පැහැදිලි වන්නේ දෙමාපිය ගුරුවර අවවාද නිසා සිය දිවි පවා තොර කර ගැනිමට සිසුන් පෙළඹීමෙනි. එනම් චිත්තවේග පාලනයට වත්මන් අධ්‍යාපනයෙන් ලැබෙන ඉඩ ප්‍රස්තා අඩු බව ඉන් පැහැදිලි වේ.

## නිගමනය

සමාජයේ කුමන අවධියක වුවද මනා යහපැවත්ම උදෙසා සදාචාරාත්මක බව අවශ්‍ය වේ. සදාචාරයෙන් තොර අධ්‍යාපනය නිෂ්ඵලය. යහපත් පුරවැසියෙකු බිහි කිරීමේ පරමාර්ථය ගිලිහී යාමට හේතු වේ. තරගකාරීත්වය ඇතිකළ යුත්තේ

තමා තුළ මිස අන් අය සමග නොවේ. එම තරගකාරීත්වය යහපත ජයගැනීමටත් අයහපත පරාජයටත් විය යුතුය. ගුණධර්ම අධ්‍යාපනයේ ම කොටසක් ලෙසත් එය සියලු විෂයන්ගෙන් අවධාරණය වන්නක් බවටත් පත්විය යුතුය. සදාචාරාත්මක ජීවන දර්ශනයක් ගොඩනැගෙන්නේ එවිටය.

**ප්‍රමුඛ පද**: සදාචාරය, ජනප්‍රිය පාසල, තරගකාරී අධ්‍යාපනය, සම්භාව්‍ය අධ්‍යාපනය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

*ධම්මපදය,* (1962) (සංස්.) සිරි ඤාණෝභාසතිස්ස, මොරගොල්ලේ කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

අදිකාරී, අබයරත්න. (1991). *ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා සහ සඟන.* මරදාන: ගොඩගේ ප්‍රකාශකයෝ.

ගලගමගේ, එස්. (2005). *අධ්‍යාපන සමාජ විද්‍යාව.* පන්නිපිටිය: කර්තෘ ප්‍රකාශන.

රාහුල හිමි, වල්පොල. (1962). *ලක්දිව බුදුසමයේ ඉතිහාසය.* කොළඹ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

විජයසුමන, වරදිවෙල. (2014). *සමාජානුයොජනය සංකල්පය බෞද්ධ ප්‍රවේශය.* කොළඹ: සේරී ප්‍රකාශන.

BHIKSHU UNIVERSITY OF SRI LANKA
07 APR 2015
LIBRARY



50812